**මදුරාවල ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දින මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ශුද්ධ වත්කම් වල අඩුවීම.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් වල අඩුවීම පහත පරිදි විය.

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| ස්ථාවර වත්කම් | 35,536,592 | 35,071,625 |
| කාරක ප්‍රාග්ධනය | 18,960,612 | 22,557,568 |
| ශුද්ධ වත්කම් | 54,497,204 | 57,629,193 |

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2006 වර්ෂයේදී මදුරාවල ප්‍රාදේශීය සභාව බුලත්සිංහල ප්‍රාදේශීය සභාවෙන් වෙන් කර වෙනම සභාවක් ලෙස ආරම්භ කිරිමේදී ලබා දී තිබූ ගිණුම් ශේෂ ඒ ඒ ගිණුම් වලට ගලපා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ශේෂයන් එම ගිණුම් වලින් ඉවත් කර බුලත්සිංහල ප්‍රාදේශීය සභා ගිණුම ලෙස වෙනම ගිණුමකට ගිණුම් ගතකර තිබීම නිසා ඉන් සමාලෝචිත වර්ෂයේ වත්කම් හා වගකීම් ශේෂ වලට සිදු වී තිබූ බලපෑම ගිණුම් වලින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සේවය හැර යාම, මිය යැම, අධිකරණ තීන්දුවක් මත බන්ධනාගාර ගතවීම හා ස්ථාන මාරු වී ගොස් තිබූ සේවකයින් 6 දෙනෙකු ගෙන් එකතුව රු.91,900 ක් වූ ණය ශේෂයෙන් වර්ෂ 4 ක සිට කිසිදු වාරිකයක් අය වී නොතිබුණි.

1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | වාහන භාර නිලධාරි විසින් සෑම මාසයක් අවසන් වීමෙන් පසුව ඊලඟ මාසයේ 15 දිනට පෙර 268(අ) පොදු ආකෘතියයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත සකස් කර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් සභාවේ කිසිදු වාහනයක මාසික සාරාංශ සකස් කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සංචිත වාහන වල ඉන්ධන දහනය පිළිබඳ මාස 06 කට වරක් පරීක්ෂා කළ යුතු වුවත් එසේ පරීක්ෂා කිරීමට ලක් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,192,306 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,278,368 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| (i.) වරිපනම් හා බදු | 2,026 | 1,741 | 923 |
| (ii.) බදු කුලී | 23 | 23 | 188 |
| (iii.) බලපත්‍ර ගාස්තු | 314 | 314 | -- |
| (iv.) වෙනත් ආදායම් | 4,229 | 7,344 | 5,053 |

2.2.2 **වරිපනම් හා අක්කර බදු**

2013 දෙසැම්බර් 31 දිනට දේපල 1415 කින් රු.682,683 ක වරිපනම් බදු ශේෂයක් ද, දේපල 15 කින් රු.5,626 ක අක්කර බදු ශේෂයක්ද හිඟව පැවති අතර විගණිත දිනය වූ 2014 පෙබරවාරි 12 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **කර්මාන්ත හා ව්‍යාපාර බදු**

2006 වර්ෂයට පෙර සිට පැවත එන ව්‍යාපාර 42 කට අදාල හිඟ කර්මාන්ත බදු රු.29,770 ක්ද, ව්‍යාපාර 29 කට අදාල හිඟ ව්‍යාපාර බදු රු.8,950 ක්ද 2014 පෙබරවාරි 12 දින වූ විගණිත දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 **ඉඩම් විකිණීම මත බදු**

2013 වර්ෂයේ ඉඩම් විකිණීම් 4 කින් සියයට 1 ක බදු මුදල් වශයෙන් රු.1,031,560 ක ප්‍රමාණයක් අයකරගෙන තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් කට්ටි කර හෝ වෙන්දේසි කර විකුණනු ලබන විට එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට 1 කට සමාන බද්දක් සභාව විසින් අයකර ගත යුතු වුවත් අයකරගෙන තිබූ මුදල් ඉඩමේ ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 1 ක් වූ අතර කිසිදු අවස්ථාවක ඉඩමේ විකුණුම් වටිනාකමෙන් සියයට 1 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,500,000 |
| (ii) | මුද්දර ගාස්තු | 5,053,294 |

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

(අ) **කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය**

අලෙවි කිරීමට හා සභාව සතු සුසානභූමිවල හා පොදු ඉඩම්වල මායිම් වැට සඳහා සිටුවීමට අවශ්‍ය කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය සඳහා 2011 වර්ෂයේදී සම්මත කරගෙන තිබූ ව්‍යාපෘතියකට අනුව 2012 සහ 2013 වර්ෂවලදී පිළිවෙලින් රු.33,493 ක් හා රු.43,868 ක් වැය කර කොන්ක්‍රීට් කණු 200 ක් තනා තිබුණද ඉන් කොන්ක්‍රීට් කණු 160 ක් 2014 පෙබරවාරි 19 දින වන විටත් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව සභා පරිශ්‍රයේ තිබුණි.

(ආ) **විසිතුරු ගස් හා මල් බඳුන් සැකසීම**

2011 වර්ෂයේදී ආරම්භ කර තිබූ ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තියේ XXIV ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක් වාණිජ හා කර්මාන්ත ව්‍යවසායන්හි නිරත වීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් 2011 වර්ෂයේ ආරම්භ කර තිබූ ඉහත ව්‍යාපෘතිය සඳහා එම අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. පසුව 2012 දෙසැම්බර් 04 දින අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණද පළාත් පාලන කොමසාරිස් (බ.ප.) විසින් එය අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීමට හැකියාවක් නොමැති බව දන්වා තිබුණි.

(ii) 2011 සිට 2013 දෙසැම්බර් 31 දක්වා ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් රු.51,700 ක වියදමක් දරා තිබුණද සමස්ථ ආදායම රු.18,457 ක් වූයෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ලාභය ලැබී නොතිබුණි.

(iii) නිෂ්පාදිත විසිතුරු ගස් හා මල් බඳුන් අලෙවි කිරීමට වෙළඳපලක් නොමැති වීමෙන් රු.14,161 ක් වූ නිෂ්පාදිත අයිතම 12 ක්ද, රු.32,635 ක් වූ අර්ධ නිමි හා අමුද්‍රව්‍ය තොගයක්ද 2014 පෙබරවාරි 18 දින වන විටත් සභාවේ පැවතුණි.

(ඇ) <u>නාහල්ල බටවල මාර්ගය කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම</u>

2013 වර්ෂයේ මහනැගුම ප්‍රතිපාදන යටතේ ලැබී තිබූ රු.500,000 මුදලකින් ඉහත මාර්ගය අඩියර 3 කින් යුක්තව කුට්ටි ගල් අල්ලා තිබූ බව 2014 පෙබරවාරි 19 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර මින් අඩියර 2 ක් සභාව විසින් මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ සිදු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාව විසින් සිදු කළ කොටස් නිශ්චිතව හඳුනා ගැනීමට හැකිවන පරිදි මාර්ගය ප්‍රතිසංස්කරණය කරන කොටසේ ආරම්භක හා අවසානය නිශ්චිතව දක්වා මාර්ග සැළැස්මක් ගොනුවට ඇතුළත් කර නොතිබුණි.

(ii) 2013 ජුලි 26 දිනැති මහ නැගුම උපදෙස් අංක 2013/03 අනුව මාර්ගයේ අදාල අඩියරෙහි ආරම්භක සහ අවසාන ස්ථානයන්හි දකුණු පස ගැටි බැම්මෙහි ව්‍යාපෘති අංකය සඳහන් කළ යුතු වුවත් එසේ සඳහන් කර නොතිබූ අතර තාක්ෂණ නිලධාරිණියටද සභාව විසින් සිදු කළ කොටස් නිශ්චිතව හඳුනාගැනීමට අපහසු විය.

(iii) වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ (සංවර්ධන) 2013 මැයි 05 දිනැති මහ නැගුම උපදෙස් අංක 2013/02 හි 5.1 ඡේදය අනුව දෙපස ගැටි බැම්වල උස අඟල් 9-12 ක් පමණ විය යුතු වුවත් ඉහත මාර්ගයේ ගැටි බැම්මේ උස අඟල් 4 ක් විය.

(ඈ) <u>නාහල්ල ලාවලුගහහේන මාර්ගය ඉදිකිරිම.</u>

මහ නැගුම මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ඉහත මාර්ගයේ ආරම්භක මීටර් 110 ක ප්‍රමාණයක් 2012 වර්ෂයේදී රු.481,022 ක වියදමින්ද, අවසාන මීටර් 112.5 ක ප්‍රමාණය 2013 වර්ෂයේදී රු.498,796 ක වියදමින්ද වශයෙන් මාර්ගය සම්පූර්ණයෙන් කුට්ටි ගල් අල්ලා අවසන් කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 ජුලි 26 දිනැති මහ නැගුම උපදෙස් අංක 2013/03 අනුව එක් එක් අඩියරයන්හි මාර්ගයේ ආරම්භක හා අවසාන ස්ථානයන්හි දකුණු පස ගැටි බැම්මෙහි ව්‍යාපෘති අංකය සඳහන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ii) වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ (සංවර්ධන) 2013 මැයි 05 දිනැති මහ නැගුම උපදෙස් අංක 2013/02 හි 5.1 ඡේදය අනුව දෙපස ගැටි බැම්වල උස අඟල් 9-12 ක් පමණ විය යුතු වුවත් මෙම මාර්ගයේ ගැටි බැම්වල උස අඟල් 5 ක් විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

ඉඩම් කට්ටි කර වෙන්දේසි කිරීම සඳහා අනුබෙදුම් අනුමත කර තිබූ අක්කර 1 රූඩ් 3, පර්චස් 24 ක් වූ ඉඩමක අභ්‍යන්තර මාර්ග තාර දැමීම සඳහා සභාව විසින් රු.654,318 ක් 2012 සැප්තැම්බර් 14 දින අයකරගෙන ඇතත් විගණිත උනය වූ 2014 පෙබරවාරි 12 දින වන විටත් මාර්ග පද්ධතියේ වැඩ ආරම්භ නොකර අදාල මුදල් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැයකරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ව්‍යාපෘති පරිපාලනය